② ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 1857/14 - 2014 අප්‍රේල් මස 09 වැනි බදාදා - 2014.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරයේ පුරප්පාඩුව පිරවීම

අවසරය ලබා නොගෙන මාස තුනක කාල සීමාවක් සභාවේ රැස්වීම් වලට සහභාගී නොවීම හේතු කොට ගෙන අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභික ධූර පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

එම්. එම්. මොහොමඩ් අලි නම් වූ සභිකයා අයත් වන ජාතික කොංග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ඒ. ඒ. මොහමඩ් රසීන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඒ. ඒ. මොහොමඩ් රසීන් මහතා අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම්භාර නිලධාරි,
අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 02 වන දින,
මැතිවරණ කාර්යාලය,
අම්පාර.

04 - 696

1A - G 19384— 90 (2014/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ කටාන ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

පක්ෂ සාමාජිකයකුව සිටීම අවසන් වීම හේතු කොට ගෙන කටාන ප්‍රාදේශීය සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ජෙරමියස් ලක්ෂ්මන් සුරේන්ද්‍ර ප්‍රනාන්දු පුල්ලේ නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කටාන ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන යක්දෙහිගේ වික්‍රමපාල සමරතුංග මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කටාන ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, යක්දෙහිගේ වික්‍රමපාල සමරතුංග මහතා කටාන ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරි,
කටාන ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 04 වන දින,
මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

04 - 697

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.